# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/50 - 2016 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/97/එච්ඩබ්/23(3)
*මගේ අංකය* : සී/ඒඩීඑස්/අත්/ආර්ඩීඒ/එස්පී/4/8(50)

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බම්බලපිටිය කොට්ඨාස අංක 47, බම්බලපිටිය, කොළඹ මහ නගරසභා සීමාව තුළ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට කොළඹ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2016.07.25 වැනි දිනැතිව පිළියෙල කර ඇති මූලික පිඹුරු අංකය කො 8049 දරන පිඹුරේ කැබලි අංක 50න් පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0758 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි (1):

01. **කැබලි අංක 50**

ඉඩමේ නම: –; ඉඩමේ විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: නාගරික සංවර්ධන අධිකාරිය, අංක 27, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10; මුල් හිමිකම් කියන්නා: –(මු. පි. කො. 7144 හි 1 වැනි කැබැල්ලේ කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0758.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් 09 වැනි දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, "මගනැගුම මහමැදුර", 4 වන මහලේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2016 සැප්තැම්බර් 02 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණය දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

ඩී. එම්. දයාරත්න
අධ්‍යක්ෂ (ඉඩම්) හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
මාර්ග සංවර්ධන අධිකාරිය.

ඉඩම් අංශය
මාර්ග සංවර්ධන අධිකාරිය,
4 වන මහළ, "මගනැගුම මහමැදුර",
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
2016-08-22 දින

09 - 318


1A - G 24093 - 17 (2016/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.